ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් 35 දෙනෙකු සඳහා ඉන්දියාවේ iCISA හිදී ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් 35 දෙනෙකු සඳහා සංවිධානය කරන ලද ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් 2025 දෙසැම්බර් 08-19 දින දක්වා ඉන්දියාවේ නොයිඩා හි තොරතුරු පද්ධති සහ විගණනය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (iCISA) දී පැවැත්විණ.

2. 2002 මාර්තු මාසයේ පිහිටුවන ලද iCISA ආයතනය ඉන්දියාවේ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් විගණන පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ තොරතුරු තාක්ෂණ විගණන කටයුතු ගෝලීය ප්‍රමිතීන් හා අනුකූල කිරීම වෙනුවෙන් කැප වී කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයකි. iCISA ආයතනය තොරතුරු තාක්ෂණ විගණනය පිළිබඳ INTOSAI ක්‍රියාකාරී කණ්ඩායම විසින් නම් කරන ලද ගෝලීය පුහුණු ආයතනයක් වන අතර මේ දක්වා රටවල් 154ක නිලධාරීන් 5000කට වැඩි පිරිසක් පුහුණු කර ඇත.

3. ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලයේ ඉල්ලීම පරිදි, පළමු සතියේදී COBIT සහ අදාළ ISO ප්‍රමිතීන්, INTOSAI මග පෙන්වීම, අවදානම් පදනම් කරගත් විගණන සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම, සයිබර් ආරක්ෂාව, දත්ත පෞද්ගලිකත්වය යනාදිය ආවරණය කරමින් තොරතුරු තාක්ෂණ විගණනය වෙත අවධානය යොමු කරන ලදී. එසේම, සිද්ධි අධ්‍යයන සහ ප්‍රායෝගික අභ්‍යාස මෙන්ම අති නවීන පරිගණක ආයතනයක් වෙත සහ නව දිල්ලියේ සහ අග්‍රා හි සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා ද පළමු සතියට ඇතුළත් විය. දෙවන සතියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ඩිජිටල්කරණය, Government e-Marketplace විගණනය, විශේෂයෙන්ම දුම්රිය සහ ආරක්ෂක ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රසම්පාදන විගණන සහ දත්ත ඇනලිටික්ස් සහ නැගී එන තාක්ෂණයන් යනාදී තේමාවන් ආවරණය කරමින් පොදු ප්‍රසම්ප්පාදන විගණනය වෙත අවධානය යොමු කරන ලදී.

4. මෙම වැඩසටහන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ධාරිතා ගොඩනැගීමේ ක්ෂේත්‍රය තුළ දැනට ක්‍රියාත්මක ද්විපාර්ශ්වික සහයෝගිතා රාමුව යටතේ සංවිධානය කරන ලදි. මෙම මුලපිරීම ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් මස ශ්‍රී ලංකා සංචාරය අතරතුර සිදු කරන ලද නිවේදනය මත පදනම්ව ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂ පුහුණු අවස්ථා 700ක් අමතර වශයෙන් එක් කරමින් තව දුරටත් ඉහළ නංවන ලදි.

***

කොළඹ

*2025 දෙසැම්බර් 27*